පහත දැක්වෙන සංසිද්ධිය සලකන්න.

01.එක්තරා සිසුවියකට P නම් වදන් සැකසුම් මෘදුකාංගයක් භාවිතයෙන් වාර්තාවක් පිළියෙල කිරීමට අවශ්‍යව ඇත.වාර්තාව යතුරු ලියනය කිරීමට පෙර ඇය Q නම් ප්‍රතිවෛරස මෘදුකාංගයක් මගින් පරිගණකයෙහි දෘඩ ඩිස්කය පරිලෝකනය (Scan) කරයි.වාර්තාව සම්පූර්ණ කිරීමෙන් පසුව ඇය විසින් S නම් මෙහෙයුම් පද්ධතිය මගින් සපයා ඇති R නම් උපස්ථ මෘදුකාගය භාවිත කර එක්තරා ෆෝල්ඩරයක ඇති සියලුම ගොනු,සැනෙළි මතකයකට පිටපත් කරනු ලබයි.

ඉහත ඡේදයෙහි P,Q,RS ලෙස නම් කර ඇති මෘදුකාංග පහත දී ඇති ලැයිස්තුවෙහි ඇති කුමන මෘදුකාංග වර්ගයට අයත් වේ දැයි හඳුනාගෙන ලියා දක්වන්න.

ලැයිස්තුව - යෙදුම් මෘදුකාංග (Application Software),පද්ධති මෘදුකාංග (Systems software),උපයෝගිතා මෘදුකාංග ( Utility Software)

02.පහත සඳහන් යෙදුම් පැකේජ සලකා බලන්න.

A - දත්ත සමුදාය යෙදුම් පැකේජ

B - සමර්පණ පැකේජ

C - පැතුරුම්පත් පැකේජ

දත්ත ආවයනයට හා සැකසීමට (Process) භාවිත කළ හැක්කේ ඉහත සඳහන් දෑ අතුරෙන් කවරක්ද?

(1.)A සහ B පමණි. (2.)A සහ C පමණි. (3.)B සහ C පමණි. (4.)A,B සහ C යන සියල්ලමය.